**ඉතිහාසය - 12 ශ්‍රේණිය**

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - 5 වන පාඩම**

**දයාබර දූවේ පුතේ,**

ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳව ඔබ අවබෝධයෙන් සිටින බව අපගේ විශ්වාසයයි. එබැවින් ඔබගේ විෂය නිර්දේශයේ එන 05 වන පාඩමට අදාළ සටහන් නැවත කියවා පහත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලිවීමට උත්සාහ කරන්න. ඔබට ජය නියතයි.

01) **දේවානම්පියතිස්ස රාජ්‍ය සමය** දේශපාලන මෙන්ම සංස්කෘතික ක්ෂේත්‍රයේද අතිශයින් වැදගත් අවධියකි.

i. දේවානම්පියතිස්ස රජුට සමකාලීනව ඉන්දියාවේ සිටි මෞර්ය පාලකයා නම් කරන්න. (ල.01)

ii. මිහිඳු හිමියන් සමඟ ලංකාවට වැඩම කළ භික්ෂූන් දෙනමක් සඳහන් කරන්න. (ල.02)

iii. මහින්දාගමනයට පෙර ශ්‍රී ලංකාවේ ප්‍රචලිතව පැවති ආගමික විශ්වාස සැකෙවින් දක්වන්න. (ල.04)

iv. දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ දේශපාලන හා සංස්කෘතික වැදගත්කම විචාරාත්මකව විමසන්න. (ල.09)

02) දිවයින එක්සත් කිරීමෙහිලා මාගම පාලකයන්ගේ දායකත්වය පහත දැක්වෙන ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කරමින් පරීක්ෂා කරන්න.

a) දුටුගැමුණු ගාමිණී රජුගේ පාලන සමයේ ආරම්භයට පෙර මාගම පාලකයන් අනුගමනය කළ ප්‍රතිපත්ති (ල.09)

b) දුටුගැමුණු ගාමිණී රජුගේ ජයග්‍රහණ (ල.07)